# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව
## (සංස්ථාගත කිරීමේ)

**ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කේ. පියදාස මහතා විසින්
2016 අගෝස්තු මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජූලි මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[127 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 010126—225 (2016/08)

# ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ)

## ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

**පූර්විකාව.**

"ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, එකී සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව, එකී ආයතනයේ, පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2016 අංක දරන ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව සංස්ථාගත කිරීම.**

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාවේ දැනට සාමාජිකයන්ව වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන්, "ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

2—PL 0010027 -300 (2016/06)

(අ) පාසල් අධ්‍යාපනයෙන් සමුගත් වයස අවු. 16-25 අතර තරුණ, තරුණියන් සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC ) හා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමග එක්ව වෘත්තීය පුහුණුව ලබා දීම;

(ආ) දිළිඳු දෙමාපියන්ගේ ළදරුවන් උදෙසා ළදරු පාසල් සේවාව ලබා දීම;

(ඇ) මත්ද්‍රව්‍යවලට නවකවගතවූවන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) නොදියුණු සමාජගත පැල්පත්වාසීන්ගේ පාසල් නොයන දරුවන් හට අධ්‍යාපනය ලබා දීම;

(ඉ) දරිද්‍රතාවය හේතුකොටගෙන කුසගින්නෙන් පෙළෙන පාසල් නොයන දරුවන් හට ආහාර පාන ලබා දී පෝෂණය කොට ඔවුන් අධ්‍යාපනයට යොමු කිරීම;

(ඊ) ළමයින් උදෙසා වූ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් තුළින් (CFCD) ළමයින් යොදවා කණ්ඩායම් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් යහපත් වැඩිහිටියන් ලෙස ප්‍රවර්ධනය කිරීම;

(උ) කුඩා දරුවන්, ගැබිණි කාන්තාවන් හා කිරි දෙන මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන් පැවැත්වීම;

(ඌ) මානසික හීනතාව තුළ පීඩා විඳින දරුවන් සඳහා උචිත අධ්‍යාපන වැඩසටහන් කණ්ඩායම් ලෙස ක්‍රියාත්මක කරවීම;

(ඔ) දිළිඳු මව්වරුන්ට ණය, ආධාර සහ අවශ්‍ය උපදේශනය ලබා දී, ස්වේච්ඡා රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (අන්‍යොන්‍ය උපකාරී කණ්ඩායම්);

(ඕ) ආගමික, සංස්කෘතික, ක්‍රීඩා ආදී ක්‍රියාකාරකම් තුළින් සිසු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව —

(අ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් මුදලින් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම;

(ආ) සමාන අරමුණු ඇති දේශීය හා විදේශීය ආයතන සමග සබඳතා ඇති කරගැනීම සහ උපකාර ලබා ගැනීම;

(ඇ) සංස්ථාවට අයත්, මුදල් හෝ වත්කම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම, ආපසු ගැනීම හෝ ප්‍රතිආයෝජනය කිරීම;

(ඈ) සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි නිලධාරීන් හා සේවකයින් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම, ඔවුනට වැටුප් හෝ දීමනා ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය හා සේවයෙන් පහකිරීම;

(ඉ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාරගැනීම, වට්ටම් දීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම, නිකුත් කිරීම, ඇතුළුව, ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඊ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ මුදල් ලබා ගැනීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමට අවශ්‍ය වන ආනුෂංගික හෝ යෝග්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්වේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ බලපවත්වන රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව ගරු ප්‍රාදේශාධිපති සහෝදරතුමා විසින් තෝරා පත්කර ගනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) ආයතනයේ වත්මන් විධායක අධ්‍යක්ෂ සංස්ථාවේ ප්‍රථම විධායක අධ්‍යක්ෂවරයා විය යුතු ය. එම අභිමතය පරිදි සියලු සේවා හා සංවර්ධන කටයුතු ඉටුවිය යුතු අතර, ගරු ප්‍රාදේශාධිපති සහෝදරතුමාගේ අභිමතය පරිදි පත්කර ඇති එකී ධුරයෙහි කටයුතු හා වගකීම් ඉටු කිරීමට පූර්ණ සහයෝගය ලබා දිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් තෝරා පත්කර ගැනීම ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය හා කර්තව්‍ය ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන හා රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යායපත්‍ර, ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාවේ අරමුදල.**

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, සම්මාදම්, ආධාර මුදල්, ගාස්තු, හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින් මතු ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම හෝ පුනරුත්ථාපනය කිරීමේ අරමුණු සඳහා සංස්ථාව විසින් ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් පිහිටුවිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාවේ ගිණුම් සහ විගණනය.*

**8.** (1) සංස්ථාවට ලැබුණු සියලුම මුදල් සහ සංස්ථාව විසින් කරන ලද වියදම් පිළිබඳව නිසි ලෙස ගිණුම් තබා ගැනීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරුන් විසින් සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක්වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුත්තේ ය.

*ආයතනය විසින් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.*

**9.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට අය විය යුතු සියලු ණය හා ආයතනය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**10.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.*

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ ඩිලාසාල් නිකායේ ගරු ප්‍රාදේශාධිපති සහෝදරතුමාට හිමිවිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ ද, ස්වකීය රීති අනුව යම් ආදයමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම රීති මගින් තහනම් කර ඇත්තාවූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය හැකි ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**12.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ විධායක අධ්‍යක්ෂවරයාගේ භාරයේ තිබිය යුතු අතර, එය විධායක අධ්‍යක්ෂවරයා විසින් හා සංස්ථාවේ බලපවත්නා රීතිවලට අනුව පරිහරණය කළ යුතු ය.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන් හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය ආයතනයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.